
# සිංහල භාෂා සාහිත්‍යයේ අභයසුන්දර ලකුණ

**වියත් පඬිවරයකු මෙන්ම ප්‍රවීණ කවියකු වූ විමල් අභයසුන්දර සූරීන්ගේ 101 වැනි ජන්ම දිනය මේ මස 17 වැනිදාට යෙදී තිබුණි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

**ලංකාවේ බොහෝ කවියන් - පඬිවරයන් සේම ලේඛකයන් අභාවයෙන් පසුව සිහිපත් කරන්නේ ඒ ඒ පුද්ගලයාගේ දරු මල්ලන්ගේ කැපවීමෙනි. දරුමල්ලන් නොමැති පුද්ගලයන්ගේ නාමය අභාවය සමඟින්ම කාලය වැලිතලාවට යටව යන සොබාවයක් තිබේ. ඇතැම් පුද්ගලයන්ගේ දරුවන් සිටියත් ඔවුන් තමන්ගේ අභිවෘද්ධියම පතන සිරිත නිසාදෝ, සිය පියාණන් භාෂා සාහිත්‍යයට කවර තරමේ සේවාවක් කළත් ඒ පිළිබඳ ආවර්ජනය තමන්ට කවර නම් එලක් දැයි සිතා නිහඬව සිටින සෙයක් විද්‍යාමානය.**



කොළඹ යුගයේ කවීන් පවා බොහෝ විට සිහිපත් කරන්නේ 'දුර්වල කවි ලියූ' උදවිය ගැන සඳහන් කරන අවස්ථාවලදීය. සිංහල සාහිත්‍ය පෝෂණය කළ පරිවර්තකයන් පවා අද සාහිත්‍ය හදාරණ උදවිය නොහඳුනන බව ඇත්තකි. මේ ලංකාවේ සංස්කෘතික ජීවිතය සම්බන්ධ ශෝචනීය යථාර්ථයෙහි පැතිකඩකි. කෙසේ නමුත් මෙවන් පසුබිමක සිය පියාණන්ගේ පත පොත තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් පුනර් මුද්‍රණය කරමින් පියාතුමන්ගේ කීර්ති නාමය වැළලී නොයන්නට කටයුතු කරන පුතෙකුගේ වෙහෙස - කැපවීම සිහිව නෙතට කඳුළක් නැඟුණු බැවින් මේ සටහන ලියන්නට සිතුවෙමි. ඒ පුත්‍රයා පුලස්ති අභයසුන්දරය, ඔහුගේ පියා වියත් කවියෙකු, ගීත රචකයෙකු හා ලේඛකයෙකු ලෙස නමක් දිනූ අභයසුන්දර පඬිවරයා වන්නේය.

විමල් අභයසුන්දර පඬිවරයා මා දැන හඳුනා ගත්තේ ඔහුගේ පුත්‍රයකු වන ප්‍රනීත් අභයසුන්දර මහතා සමග තිබුණ ඇසුර ඔස්සේය. ඒ වනවිට අභයසුන්දර මහතා ගුවන් විදුලියෙන් විශ්‍රාම ගෙන ද කලක් ගතවී තිබුණි. එනමුදු ලේඛනයෙහි ඔහු නිමග්නව සිටියේය. එතුමන් ඇතමුන් වෙනුවෙන් නිදිවරා දුක් මහන්සියෙන් ලියූ දෑ අපමණය යන්න අතිශයෝක්තියක් නොවේ. ඔහුගෙන් උපකාර ලත් සේවය ලත් බොහෝ උදවිය අදත් සිටින බවද නොරහසකි.

## ගීත නාටක සාහිත්‍ය

සංගීතය ආශ්‍රිත සාහිත්‍ය නිර්මාණ සම්බන්ධ විශේෂඥයකු වන මහාචාර්ය සුනිල් ආරියරත්න පෙන්වා දී තිබෙන කරුණු සහ විවරණ විමර්ශන අනුව මානවසිංහයන්ට පමණකි විමල් අභයසුන්දර දෙවෙනි වන්නේ. මානවසිංහයන් සුභාවිත ගීතය ඔස්සේ කීර්තිය ලබමින් එහි අභිවෘද්ධියට සිය නිර්මාණ ශක්තිය සහ භාෂා ඥානය කැප කළේය. අභයසුන්දරයන් ගීත නාටක රචනයෙහි තත්පරව ගුවන් විදුලියෙන් නිර්මාණය කොට විකාශනය කළ ගීත නාටක රැසක් ඔස්සේ සිය කවිකම හා භාෂා ඥානය ප්‍රකට කළේය.

**මහාචාර්ය සරත් විජේසූරිය**

ගීත නාටක රචනය නම් විෂයේදී අභයසුන්දර පඬිවරයාට අනන්‍ය වූ කාරණා ගණනාවක් නිරීක්ෂණය කළ හැකිය. ඉන් පළමුවැන්න නම් බෞද්ධ සාහිත්‍යය පිළිබඳ එතුමන්ගේ පරිචයයි. මුල් කෘති කියවීමෙන් අදාළ චරිත ප්‍රතිනිර්මාණයේදී එතුමන් සතු දැනුම ඉවහල් කරගෙන ඇති සැටි කැපී පෙනේ. වඩාත් වැදගත්ම කාරණය නම් භාෂාව පිළිබඳ විශාරදත්වය සේම, එතුමන්ට තිබුණ සංගීත ඥානය ද හේතුවෙන් ගීත නාටකයක 'රුව ගුණ හා රස' නොඅඩුව උද්දීපනය කිරීමට සමත් වීමය. අභාග්‍යයට අපට රස විඳින්නට පුළුවන් වූයේ කීපයකි. භාග්‍යය නම් බොහෝ ගීත නාටක සාහිත්‍ය කෘති ලෙස හෝ කියවා රසවිඳින්නට හැකි වීමය.

අභයසුන්දර කිවිඳුන්ගේ ගීත නාටකයක් කියන විට අතීතයේ ගුවන් විදුලිය රසික සමාජයේ රසඥතාව නැංවීමට මෙන්ම භාෂා ඥානය දියුණු කිරීමද ප්‍රතිපත්තියක් කරගෙන සිටින බව සනාථ වේ.

චරිතයක්- කථා වස්තුවක් රසවත්ව ඉදිරිපත් කරමින් භක්ති රසය ජනනය කරනු පිණිස අභයසුන්දර කිවිඳුන් අසමසම වී ඇති සැටිද හඳුනා ගන්නට හැකිය.

ගීත නාටකය ගැන සේම ගීතය ගැනද, මුලින්ම ලිඛිතව ශාස්ත්‍රීය විවරණ සපයා තිබෙන්නේද අභයසුන්දර පඬිවරයා විසිනි. මතු දැක්වෙන්නේ එතුමන් 1959 වසරේදී පළ කළ ''නිෂාදී'' කෘතියට සම්පාදනය කර තිබෙන දීර්ඝ ආමුඛයෙන් අදහස් කිහිපයකි.

''බටහිර දිග සංගීතයෙහි ප්‍රාවෛධික ප්‍රයෝගයක් වන (OPERA) යන්න බලාගෙන එවැන්නකට අපි ගීත නාටක යයි කියමු. අපරදිග ගීත නාටකය දීර්ඝ ඉතිහාසයක් ඇත්තකි. ගීත නාටක යනුවෙන් අදහස් කරනුයේ සංගීතය අනුව සකස් කළ නාටක විශේෂයක් වේ. එය ප්‍රධාන වශයෙන් කලා අංශ දෙකකින් සමන්විතය. අනෙක් නාටකවලින් ගීත නාටකය පහසුවෙන් වෙන් කර ගැනීමට පිළිවන. සාමාන්‍ය නාටක, ඇතැම් විට අතරින්පතර යෙදූ සංගීතාංගයන්ගෙන් සංයුක්ත වුවද එහි සංගීතයට ප්‍රධාන තැනක් නොලැබේ. එයට සංගීතය යොදනුයේ චතක් විසිතුරු කිරීමට රඟ කවන්නාක් මෙනි. එහෙත් ගීත නාටකය ඉඳුරාම සංගීතාත්මකය... අපේ සාහිත්‍යයට හා සංගීතයට එක්වූ නවාංගයෙකි, ගීත නාටකය. මෙය බටහිර දිග සංගීතාංගයක් අනුව සකසා ගත්තක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. සියුම් සංගීත රසයක්ද ගැඹුරු සාහිත්‍ය රසයක්ද මෙයින් ඉස්මතු කිරීමට පිළිවන.

ගීත නාටක නිර්මාණය හා ඒ පිළිබඳ ශාස්ත්‍රීය කරුණු දැක්වීම ඔහු සිදු කර තිබෙන්නේ ආධුනිකයන්ට ඒ විෂය ගැන හදාරා එහි නිමග්න වීමට අධ්‍යාපනයක් ලබාදීමක් ලෙසින් යයි සිතේ. අදින් දශක හයකට-හතකට පෙර ගීත නාටක රචනයට අභයසුන්දර කවියාගේ-පඬිවරයාගේ අවතීර්ණ වීම,ඓතිහාසික අගයකින් අනූනය. ඒදවස එතුමන් ඇසූ පිරූ තැන් ඇත්තෙකු පමණක් නොව නිර්මාණාත්මක ප්‍රකාශන ශක්තියකින්ද පොහොසතකු වී සිටි බවක් හඟින්නට පුළුවන.

සැබවින්ම ගුන්විදුලිය කොතරම් උසස් තත්ත්වයක තිබුණේද? කොතරම් උසස් සේවාවක් රටට සිදු කළේද? අද හැම අංශයකින්ම අසන්නට දකින්නට තිබෙන්නේ පරිහානියකි.

## ගීතය සහ සංගීතය

ගීත රචනයෙහි අභයසුන්දර කවියා නිමග්න වන්නේ 'ජනප්‍රිය වන අරමුණකින්' නොවේ යයි සිතමි. එදවස එවැනි මානසිකත්වයක් නොතිබුණා වන්නටත් පුළුවන. එතුමන්ගේ පදමාලාවක් වන වසන්තා සන්දනායක ගායනා කළ පී.ඩී. ඩික්සන් පෙරේරා සංගීතවත් කළ ''දෙළ ළඟ ගුරු පාර දිගේ එච්- සිනහ පපා ටිකිරි නඟා...''යනුවෙන් පටන්ගෙන ගයන ගීතය වැනි ගීත එතුමන් අතින් වැඩිපුර ලියැවී නැත. පසු කලෙක නන්ද මාලනී ගායනා කළ මේ පදමාලාව රසික සමාජයේ ඉමහත් අවධානයට ලක්වුණ වග නොරහසකි. මෙවැනි පදමාලා රචනාකොට,-ගුවන් විදුලිය සමඟ- සංගීතඥයන් සමඟ- ගායක ගායිකාවන් සමඟ මනා සම්බන්ධතාවක් තිබුණ එතුමන්ට ඒ යුගයේ ජනප්‍රිය රචකයා වන්නට නොතිබුණේද?

ගීතය සම්භාව්‍ය කලාංගයක් ලෙස රැක ගන්නට මහන්සි ගත් අභයසුන්දරයන් ගීතයට අද ඇති තත්වය දකින්නට නොසිටීම එතුමන්ගේ භාග්‍යයක් යයි සිතමි.

ගීත රචනය හැඳින්වීමට ''ගේය පද රචනය''යන යෙදුම භාවිතයට ගෙන එය තහවුරු කිරීමට කටයුතු කළේ මහාචාර්ය සුනිල් ආරියරත්න යයි සිතමි. එනමුත් මේ පදය අභයසුන්දරයන් ''නිෂාදී'' කෘතියෙහි භාවිත කර තිබෙන සැටියක්ද දකින්නට පුළුවන. ඉන් ගම්‍ය වන්නේ සංගීතයට අදාළ සාහිත්‍යයක් ගොඩ නඟා එය පෝෂණය කිරීමට එතුමන්ට අවශ්‍ය වූ බව නොවන්නේද?

## සාහිත මෙහෙවර

අභයසුන්දර පඬිතුමා එතුමන් මහත් පරිශ්‍රමයකින් රචනා කරන ලද කවි ගීත සංඛ්‍යාව විශාලය. ඒ ඒ විෂයන්ට අදාළව ලියා පළ කර තිබෙන කෘති සංඛ්‍යාව පනහක් පමණ වේ. වියත් වහරක් තනා ගනු පිණිස උනන්දු වන කවරෙකුට වුව අභයසුන්දර'නිර්මාණ - ලේඛන පරිශීලනය' සප්‍රයෝජනවත්ය. එතුමන් සිය සැඳෑ සමයේදී ඉමහත් පරිශ්‍රමයකින් සම්පාදනය කළ ''ආනන්ද සම්ප්‍රවේදිතය''(1990) මහකවි ආනන්ද රාජකරුණාගේ සියලු පැදි සංග්‍රහ කළ මහානර්ඝ කෘතියකි. ආනන්ද රාජකරුණා චරිතය මැනවින් මේ කෘතියෙන් ඉදිරිපත් කරන අතරම, රාජකරුණා කිවිඳුගේ නිර්මාණ මෙහෙවර හා එහි අද්විතීය ගුණ මහිමය ශාස්ත්‍රීය වශයෙන් රැස් කළ කරුණු ඔස්සේ පෙන්වා දීමක්ද සිදුකර තිබේ.

අභයසුන්දර සිරිත ආවර්ජනය කරන විට කැපී පෙනෙන්නේ ඔහු කවි රාශියක්-ගීත රාශියක් රචනා කළේ වී නමුදු, ඔහු සිය ඇතුළු හදින් පෙම්බැඳ සිටියේ සාහිත්‍ය නිර්මාණයට බවයි. එක අතකින් නිර්මාණ සාහිත්‍යයටද අනෙක් අතින් සාහිත්‍ය කලා විෂයෙහි ශාස්ත්‍රීය කෘති සම්පාදනයට යනුවෙන් පැහැදිලිව දකින්නට පිළිවන. ''මිණිහිරිය'' එතුමන්ගේ නව ප්‍රබන්ධයකි. ඓතිහාසික පුවතක් ප්‍රතිනිර්මාණය කරමින් පාඨකයාට එක පැත්තකින් දැනුමක්ද, තවත් පැත්තකින් ආස්වාදයක්ද ලබා දෙන්නට මේ කෘතියෙන් එතුමන් සමත් වී ඇත.

ගද්‍යයෙන් වේවා පද්‍යයෙන් වේවා නිවැරදිව- ව්‍යක්තව- ගැඹුරින් ලිවීම අභයසුන්දර පන්හිඳ නවතිනතුරුම සිරිත විය. සාහිත්‍ය හැදෑරීම-භාෂා සාහිත්‍ය හැදෑරීම දුබලව පවතින මෙසමයේ 'අභයසුන්දර සාහිත්‍ය කියවීම' කොතන කවර ලෙසින් පටන් ගත යුතුද යන්න ගැන විනිශ්චයක් නැති සේය. මේ වියත් රචකයා අද දැයට අමතක වී තිබේ නම් ඊට හේතු කවරේද?

1921 වසරේ සැප්තැම්බර් මස 17 වන දින ජන්මලාභය ලත් එතුමන් පරලෝ සැපත් වූයේ 2008 ජූලි 12 වැනිදාය. මේ වසරේ සැප්තැම්බර් 17 වැනිදාට එතුමන්ගේ එකසිය එක් වෙනි උපත් සමරුව යෙදී තිබුණි. ස්වකීය ජීවිත කාලයම භාෂා ශාස්ත්‍ර අභිවෘද්ධියට කැපකළ ජීවිතයක් උරුම කරගෙන සිටි අභසුන්දර කිවිඳුන්-පඬිතුමන් දැයට අමතක කළ නොහැකි- අමතක නොකළ යුතු චරිතයක් බව නොවළහා පවසනු කැමැත්තෙමි.